සන්නස

සොඳුරු හදවත් සොයා....



උමයංගනා

# නිහාල්සිංහට මහාචාර්ය ධුරයක්

සංස්කරණය
**බුද්ධිනී ජයවර්ධන**

සේයා රූ
**ශීතන් ගුණවර්ධන**

ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව පරිච්ඡේදයක ආරම්භය සනිටුහන් කරමින් ප්‍රථමවතාවට සිනමා හා රූපවාහිනී උපාධියක් කැලණි විශ්වවිද්‍යාලය මගින් ආරම්භ කෙරෙයි. සිනමාව හා රූපවාහිනිය මෙරට ජනප්‍රියතම ජනමාධ්‍ය වුවද එම විෂය පථය ආවරණය කෙරෙන උපාධි මාලාවක් ශ්‍රී ලංකාවේ කිසිම විශ්වවිද්‍යාලයකින් මේ වන තුරු ඉදිරිපත් කර නොතිබුණි.

මෙහි මූලිකත්වය ගෙන දියත් කිරීමේ කටයුත්ත සඳහා සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයේ ප්‍රවීණයකු වන ආචාර්ය ඩී. බී. නිහාල්සිංහ කැලණි විශ්වවිද්‍යාලයේ චිත්‍රපට හා රූපවාහිනී පිළිබඳ ආරාධිත මහාචාර්යවරයකු ලෙස පත්කොට තිබේ. සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයේ මහාචාර්ය පදවියකට පත් කරනු ලැබූ මෙරට ප්‍රථමයා ලෙස මේ අනුව ආචාර්ය නිහාල්සිංහ ගෞරවයට පාත්‍රවේ.

එමෙන්ම මේ ක්ෂෙත්‍ර දෙක විශ්වවිද්‍යාල අධ්‍යයනය සඳහා සුදුසු යැයි නිගමනය කිරීමේ ගෞරවය කැලණි විශ්වවිද්‍යාලයට හිමිවේ. මෙම උපාධි පාඨමාලාව ආරම්භ කිරීමේ කටයුත්ත සිදු කෙරුණේ ආචාර්ය නිහාල්සිංහ මහතා සහ ඔහුට සහාය වූ මහාචාර්ය පැට්‍රික් රත්නායක මීට වසර පහකට පෙරය. මහාචාර්ය පැට්‍රික් රත්නායක කැලණි විශ්වවිද්‍යාලයේ ලලිතකලා අංශයේ වත්මන් අංශාධිපතිවරයා වේ.

මෙම උපාධි පාඨමාලාවේ විශේෂත්වය වනුයේ එය හැදෑරීමේ හැකියාව 2016 ඕනෑම විෂය ධාරාවක විශ්වවිද්‍යාලයක සිසුන්ට අවස්ථාව ලැබීමයි. මේ අනුව වෛද්‍ය විද්‍යා මානව ශාස්ත්‍ර ධාරව වැනි ඕනෑම විෂය ධාරාවකින් ශිෂ්‍යයන් තෝරා ගැනෙයි. දැනට එසේ අයැඳුම්පත් 2100 ක් ලැබී ඇති අතර අධ්‍යයනය සඳහා හැකියාව ඇත්තේ ශිෂ්‍යන් 30 කට පමණි.

මෙම පාඨමාලාවේ අධ්‍යාපන කාලය වසර 4 ක් වන අතර සිනමාව හා රූපවාහිනි සිද්ධාන්ත පිළිබඳ අධ්‍යයන කටයුතුවලට අමතරව සිනමා නිෂ්පාදන ආයතන හා රූපවාහිනී විකාශන ආයතන ඇතුළු මෙම විෂයන්ට සම්බන්ධ ප්‍රායෝගික අත්දැකීම් ලැබීමේ අවස්ථාව සිසුන්ට හිමිවේ.



වර්තමානය වන විට සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍ර දෙක දැඩි ලෙස ඒකාබද්ධව ඇති හෙයින් එය වර්ධනය ද මෙම පාඨමාලාවේ විශේෂ අවධානයට යොමුවේ. මේ අනුව ඩිජිටල් මගින් චිත්‍රපට රූගත කිරීමෙන් එවන් රූගත කරන දර්ශන සංස්කරණයකොට සිනමාශාලාවලට ඩිජිටල් මගින් ප්‍රක්ෂේපණය කිරීමේ ක්‍රියාවලිය ද ඒ හා සමාන තාක්ෂණික දැනීම විද්‍යාර්ථීන්ට ලබාදෙනු ඇත. එයට අමතරව රූපවාහිනී වැඩසටහන් පිළිබඳ පුහුණු අවස්ථාවද උදාවනු ඇත.